**නවිතන්වේලි ප්‍රාදේශිය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**---------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 21 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 04 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 24 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට නවිතන්වේලි ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
----------------------------------------------------------

2013 ඔක්තෝබර් 02 දිනැති අංක 03/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව 2011 වන වසරේ සිට ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලින් පළමු ප්‍රමිතීන් හතර අනුගමනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වූවද, ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂන විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු රු. 11,500 ක විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) විදුලි ගාස්තු ජල ගාස්තු හා දුරකථන ගාස්තු යනාදිය සඳහා සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු එකතුව රු. 6,388 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.3.3 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්

2012 වර්ෂයේදී ස්ථාන මාරුවී ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් සහ විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අයවියයුතු හිග ණය ශේෂය වන රු. 42,689 ක මුදල අයකර ගැනීම සඳහා 2014 ජුනි 19 දින දක්වා කටයුතු කර නොතිබුණි.

1.3.4 නීති, රීති සහ රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ වගන්තිය 158 | ආදායම් රැස්කරන්නාට හෝ නිලධාරියාට දේපල බදු නොගෙවූ බවට ලේකම් විසින් අත්සන් කරනු ලැබූ වරෙන්තුවක් ලබාදී නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශය සභා (මූල්‍ය හා පරිපාලන) රීති<br>පරිච්ඡේදය 1<br>වගන්තිය 5 (XII) | මුදල් සහ ගබඩා ද්‍රව්‍ය රාජකාරිම වශයෙන් පවරන ලද නිලධාරින් දෙදෙනෙකුගෙන් ආරක්ශක ඇප ලබා ගෙන නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 1,172,876 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 1,719,777 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 546,901 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 මුද්දර ගාස්තු

2013 වර්ෂයට අදාල මුද්දර ගාස්තු ප්‍රමාණය ගණනය කර රෙජිස්ටාර් ජනරාල් වරයාගෙන් 2014 ජුනි 19 දින දක්වා ලබාගෙන නොතිබුණි.

2.2.2 වෙනත් ආදායම්

(අ) විදුලි සංදේශ ආයතනවලින් ස්ථාපිත කරන ලද විදුලි සංදේශ කුළුණු 02 ක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව අයවියයුතු රු. 40,000 පමණ ගාස්තු සභාව අයකර ගෙන නොතිබුණි.

(ආ) 2006 සිට 2012 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව හිඟ මස්කඩ බදු රු. 2,543,081 ක මුදල අයකර ගැනීම සඳහා 2014 ජූනි 19 දින දක්වා කටයුතු කර නොතිබුණි.

3. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

3.1 අභ්‍යන්තර විගණනය
------------------------

එක් එක් පළාත් පාලන ආයතන තම තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බවට 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තියෙන් විධිවිධාන සලසා තිබුණ ද සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

4. පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) ආදායම් රැස්කිරීම